# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 පෙබරවාරි

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2019 පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 2.4%ක් බව ප්‍රකාශ කළේය. පසුගිය ජනවාරි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 1.2%ක් ලෙස වාර්තා විය. 2019 පෙබරවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -1.3%ක හා ආහාර නොවන කාණ්ඩයේ 3.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 පෙබරවාරි මාසයේ 3.2% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 1.6%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.5%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 ජනවාරි මාසයේ 127.3ක් වූ දර්ශකාංකය 2019 පෙබරවාරි මාසයේ 126.7 දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 පෙබරවාරි මාසයේ දර්ශකාංකය 0.6ක අඩුවීමක් එනම් 0.5ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.00%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.54%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, අමු මිරිස්, සහල්, පොල්, දෙහි, ලොකුළූණු, කෙසෙල්, අර්තාපල්, රතුළූණු සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් පැපොල්, අළුත් මාළු, මයිසූර් පරිප්පු, බිස්කට්, සුදුළූණු, වියළි හාල්මැස්සන් හා කුකුල් මස් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 පෙබරවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘අධ්‍යාපන’ (උපකාකර පංති ගාස්තු), ‘සෞඛ්‍ය' (පෞද්ගලික වෛද්‍ය ගාස්තු, ඇස් කණ්ණාඩි, වෛද්‍ය/ඖෂධ නිෂ්පාදන මිළදී ගැනීම, විශේෂඥ වෛද්‍ය ගාස්තු), 'ප්‍රවාහන' (ඉන්ධන මිල, පාසල් වෑන්රථ හැර වෙනත් වෑන් රථ ගාස්තු, පාසල්/පෙර පාසල් ප්‍රවාහන ගාස්තු), ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ (බූළත්, අරක්කු), 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (නිවාස නඩත්තු/ප්‍රතිසංස්කරණය කිරීම) , ‘විවිධ භාණ්ඩ හා සේවා', ‘රෙදිපිළි හා පාවහන්’, 'විනෝදාත්මක හා සංස්කෘතික’, ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත්, පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'සන්නිවේදන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම වෙනස් වී නොමැත.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2018** | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | -0.8 | 0.9 |
| | ඔක්තෝම්බර් | 124.9 | 0.4 | 0.1 |
| | නොවැම්බර් | 127.7 | 2.2 | 1.0 |
| | දෙසැම්බර් | 127.1 | -0.5 | 0.4 |
| **2019** | ජනවාරි | 127.3 | 0.2 | 1.2 |
| | පෙබරවාරි | 126.7 | -0.5 | 2.4 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව